# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1688/5 - 2011 ජනවාරි 11 වැනි අඟහරුවාදා - 2011.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව තුළ 1972 අංක 07 දරන ගෙවල් කුලී පනත යටතේ ප්‍රකාශිත ප්‍රදේශ සහ ගෙවල් කුලී මණ්ඩල සංස්ථාපනය කිරීමේ නිවේදනය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ මාර්ග සංවර්ධන විදුලි බල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය බන්දුල එස්. බී. යාලෙගම වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමග කියැවෙන, වරින් වර සංශෝධිත 1972 අංක 07 දරන ගෙවල් කුලී පනතේ විධිවිධාන මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මකවීම පිළිබඳව පහත සඳහන් ආඥා ප්‍රකාශයට පත්කරමි :–

1. (I) මධ්‍යම පළාතේ දැනට ගෙවල් කුලී පනත ක්‍රියාත්මක වන බලප්‍රදේශ සහ එකී පනත ක්‍රියාත්මක විය යුතු යැයි මාගේ මතය වන ප්‍රදේශ සඳහා එක් එක් ගෙවල් කුලී මණ්ඩල පිහිටුවා පවත්වාගෙන යෑමේ දුෂ්කරතාවයක් මතුවී ඇති බව මාගේ මතය වන බැවින් ද, එකී ප්‍රදේශ තුළ පදිංචිව සිටින්නා වූ කුලී නිවැසියන් හේතුවෙන් එකී ප්‍රදේශ පනතින් බැහැර ප්‍රදේශ වශයෙන් නම් කොට පනතින් බැහැර කිරීමේ දුෂ්කරතාවයක් පැන නැගී ඇති බැවින් ද, ඉහත කී දුෂ්කරතාවයන් මගහැරවීම සඳහා පනතේ ප්‍රතිපාදන නොමැති බැවින් ද, පනතේ 45 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පනතේ 2(1)(*ආ*) සහ 38(1) උපවගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල පහත සඳහන් ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතු බවට ආඥාවක් ප්‍රකාශයට පත්කරමි.

   (II) පනතේ 2(1) (*ආ*) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි උපලේඛනයේ පළමු තීරුවෙහි දක්වා ඇති ප්‍රදේශ තුළ මෙම පනත ක්‍රියාත්මක විය යුතු බවට ප්‍රකාශයට පත්කරමි. තව ද, පනතේ 38(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පනතේ ඉහත කී 2 (1) (*ආ*) උපවගන්තිය ප්‍රකාර ප්‍රකාශයට පත්කරන්නා වූ එක් එක් ප්‍රදේශ සඳහා එකී උපලේඛනයේ දෙවැනි තීරුවේ දක්වා ඇති පරිදි ගෙවල් කුලී මණ්ඩල තුනක් සංස්ථාපනය කරනු ලැබේ.

2. මෙම ආඥාව මෙම අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**අවලංගු කිරීම් හා සංක්‍රමණ විධිවිධාන**

3. (I) 2003 ජුනි මස 25 දිනැති අංක 1294/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (*අ*) වැනි කොටසේ පළාත් සභා නිවේදන යටතේ ප්‍රකාශයට පත්කළ මධ්‍යම පළාතේ පළාත් සභාවේ ගෙවල් කුලී මණ්ඩල බල ප්‍රදේශ ඒකාබද්ධ කිරීමේ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

1A - PG 001216 —335 (2011/01)

(II) ඉහත කී මධ්‍යම පළාතේ පළාත් සභාවේ ගෙවල් කුලී මණ්ඩල බල ප්‍රදේශ ඒකාබද්ධ කිරීමේ නිවේදනය අවලංගු කිරීම නොතකා –

(අ) යම් ස්ථානයක් සම්බන්ධයෙන් ඒ නිවේදනය යටතේ යම් ගෙවල් කුලී මණ්ඩලයක් විසින් කරන ලද සෑම ආඥාවක් ම හෝ තීරණයක් ම මේ නිවේදනයේ අනුරූප විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි පවත්නා ගෙවල් කුලී මණ්ඩලය විසින් කරන ලද ආඥාවක් හෝ තීරණයක් ලෙස සැලකිය යුතු අතර, එය ඒ අනුව බල සහිත විය යුතු ය.

(ආ) ගම්පොල ගෙවල් කුලී මණ්ඩලය හැර ඒ නිවේදනය යටතේ පිහිටුවන ලද එක් එක් ගෙවල් කුලී මණ්ඩලය මේ නිවේදනය යටතේ ධුරප්‍රාප්තව සිටිය යුතු අතර, මේ නිවේදනය යටතේ ගෙවල් කුලී මණ්ඩලයක් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, එහි සාමාජිකයින් මේ නිවේදනය යටතේ අලුත් පත්කිරීම් කරනු ලබන තුරු ඒ ආකාරයෙන් ම ධුර දැරිය යුතුයි.

(ඇ) මේ නිවේදනය ආරම්භවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ ඒ නිවේදනය යටතේ යම් ගෙවල් කුලී මණ්ඩලයක් ඉදිරියේ විභාග වෙමින් පවත්නා සියලු නීති කෘත්‍ය ඒ නිවේදනය අවලංගු නොකරනු ලැබුවාක් මෙන් පවත්නා ගෙවල් කුලී මණ්ඩලය ඉදිරියේ සියලු ලෙසින් අසා නොකඩවා පවත්වාගෙන යා යුතු ය.

(ඈ) ඒ නිවේදනය යටතේ කරන ලද යම් නියමයක් ; නිකුත් කරන ලද යම් සහතිකයක් ; කරන ලද යම් ගෙවීමක් ; දෙන ලද යම් දැන්වීමක් ; නැතහොත් කරන ලද යම් තීරණයක්, විධානයක් ; ආඥාවක් ; නිකුත් කිරීමක් ; ඉල්ලීමක් හෝ දෙයක් මේ නිවේදනය ආරම්භවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි බලපවත්නේ නම් එය නොකඩවා බල පැවැත්විය යුතු අතර, මේ නිවේදනය යටතේ එය කළ හැකිතාක්, නිකුත් කළ හැකිතාක් හෝ දිය හැකිතාක් දුරට එය මෙම නිවේදනයේ අනුරූප විධිවිධාන යටතේ නිකුත් කර හෝ දී තිබුනාක් මෙන් බලසහිත විය යුතු ය.

4. 2010 අගෝස්තු මස 06 වැනි දිනැති අංක 1665/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටසේ පළාත් සභා නිවේදන යටතේ ප්‍රකාශයට පත්කළ මධ්‍යම පළාතේ පළාත් සභාවේ ගෙවල් කුලී මණ්ඩල බල ප්‍රදේශ ඒකාබද්ධ කිරීම හා බලප්‍රදේශ නිශ්චය කිරීමේ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

**උපලේඛනය**

| පළමු තීරුව | | දෙවැනි තීරුව |
|---|---|---|
| අනු අංකය | බල ප්‍රදේශය | ගෙවල් කුලී මණ්ඩලය |
| (i) | මහනුවර මහනගර සභා බල ප්‍රදේශය | |
| (ii) | ගම්පොල නගර සභා බල ප්‍රදේශය | |
| (iii) | නාවලපිටිය නගර සභා බල ප්‍රදේශය | |
| (iv) | කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය | මහනුවර ගෙවල් කුලී මණ්ඩලය |
| (v) | වත්තේගම නගර සභා බල ප්‍රදේශය | (අනු. අංක i සිට xxii දක්වා බලප්‍රදේශ සඳහා) |
| (vi) | හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (vii) | අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (viii) | පස්බාගේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (ix) | පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (x) | පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *පළමු තීරුව* | | *දෙවැනි තීරුව* |
|---|---|---|
| *අනු අංකය* | *බල ප්‍රදේශය* | *ගෙවල් කුලී මණ්ඩලය* |
| (xi) | පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xii) | පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xiii) | ගඟවටකෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | මහනුවර ගෙවල් කුලී මණ්ඩලය |
| (xiv) | ගඟඉහළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | (අනු. අංක i සිට xxii දක්වා බලප්‍රදේශ සඳහා) |
| (xv) | උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xvi) | උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xvii) | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xviii) | මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xix) | යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xx) | මිනිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxi) | තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxii) | උඩුදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxiii) | මාතලේ මහනගර සභා බල ප්‍රදේශය | |
| (xxiv) | මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | මාතලේ ගෙවල් කුලී මණ්ඩලය |
| (xxv) | අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxvi) | උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | (අනු. අංක xxiii සිට xxxiv දක්වා බල ප්‍රදේශ සඳහා) |
| (xxvii) | යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxviii) | රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxix) | නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxx) | දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxxi) | පල්ලේපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxxii) | ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxxiii) | ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxxiv) | විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xxxv) | නුවරඑළිය මහනගර සභා බල ප්‍රදේශය | |
| (xxxvi) | හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය | |
| (xxxvii) | තලවකැලේ - ලිඳුල නගර සභා බල ප්‍රදේශය | නුවරඑළිය ගෙවල් කුලී මණ්ඩලය |
| (xxxviii) | නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | (අනු. අංක xxxv සිට xlii දක්වා බල ප්‍රදේශ සඳහා) |
| (xxxix) | කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xL) | වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xLi) | හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| (xLii) | අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |

බන්දුල එස්. බී. යාලෙගම,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ මාර්ග සංවර්ධන,
විදුලි බල හා බලශක්ති නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

2010 දෙසැම්බර් මස 29 වැනි දින,
යටිනුවර වීදිය,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ මාර්ග සංවර්ධන,
විදුලි බල හා බලශක්ති, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ දී ය.

01-532

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.